# ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය සම්පූර්ණ කිරීමට හා ඇස්තමේන්තුගත බදු වාරිකය ගණනය සඳහා උපදෙස්

**(අ) ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

01. ඔබ විසින්, ගෙවිය යුතු ඇස්තමේන්තුගත බද්ද ගණනය කිරීම සඳහා යොදාගත හැකි පහත දැක්වෙන ක්‍රම 2 න් එකක් තෝරා ගන්න.

- පසුගිය වසරේ ගෙවූ බද්දට 5% ක් එකතු කිරීම.
- ආදායම් මූලාශ්‍ර ඇස්තමේන්තු කිරීම.

02. එම තෝරා ගන්නා ක්‍රමය අනුව ප්‍රකාශයේ (I) හෝ (II) කොටස සම්පූර්ණ කරන්න. ගණනය කරන ලද ගෙවිය යුතු ඇස්තමේන්තුගත බද්ද පහත පරිදි ප්‍රකාශයේ ඇතුලත් කරන්න.

- පළමු ක්‍රමය යොදා ගන්නේ නම් ප්‍රකාශයේ (I) කොටස සම්පූර්ණ කරන්න.
- දෙවන ක්‍රමය යොදා ගන්නේ නම් ප්‍රකාශයේ (II) කොටස සම්පූර්ණ කරන්න.
  [(I) හෝ (II) කොටසින් එකක් පමණක් සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් වේ]

03. ගෙවිය යුතු ඇස්තමේන්තුගත බද්ද 4 න් බෙදා එක් වාරිකයක් ලෙස දක්වමින් (III) වන කොටස සම්පූර්ණ කරන්න.

**(ආ) ඇස්තමේන්තුගත බදු වාරිකය ගණනය සඳහා උපදෙස්**

01. බදු ගෙවන්නන් විසින් ගෙවිය යුතු ඇස්තමේන්තුගත බදු වාරිකය පහත සඳහන් සූත්‍රය අනුව ගණනය කළ යුතුය.

$$\frac{A - C}{B}$$

මෙහිදී,

A යනු - පළමු ක්‍රමය හෝ දෙවන ක්‍රමය යටතේ ගණනය කළ ඇස්තමේන්තුගත බද්ද වේ.

C යනු - (අ) පෙර වාරික මගින් ගෙවන ලද බදු මුදල සහ,
(ආ) වාරික ගෙවීමට නියමිත දිනට පෙර ගෙවූ රඳවා ගැනීමේ බදු මුදල්වල එකතුවේ.

B යනු - ගෙවිය යුතු වාරික ගණන

පළමු වාරිකය ගණනය කිරීමේ දී පෙර වාරික ගෙවීමක් නොමැති නිසා ගෙවූ රඳවා ගැනීමේ බදු පමණක් (C) යටතේ අඩු කළ යුතුවේ.

**(ඇ) අවසාන ගෙවිය යුතු බදු වාරිකය ගණනය කිරීම**

සූත්‍රයට අනුව ගණනය කළ ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු වාරිකයෙන් ගෙවූ ආර්ථික සේවා ගාස්තු , (ESC) ඉදිරියට ගෙන ආ නාමික බදු බැර, [National tax Credit ((NTC)] අදාල වාරිකය සඳහා කලින් කල ගෙවීම් (Advance Payments) අඩු කල හැක.

එනම්, $\left[\frac{A - C}{B}\right]$ - ESC+NTC+ Advance Payments

02. උපයන විට ගෙවීමේ බද්දට යටත් වන සේවා නියුක්ති ආදායමක් පමණක් ඇති බදු ගෙවන්නන් හිස් ප්‍රකශයක් (Nil Return) දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන්න.

03. උපයන විට ගෙවීමේ බද්දට යටත් වන සේවා නියුක්ති ආදායමක් සහ වෙනත් ආදායම් ඇති බදු ගෙවන්නන්, මෙම ප්‍රකාශය සම්පූර්ණ කිරීමේ දී සේවා නියුක්ති ආදායම ඇතුලත් කල යුතු නැති අතර වෙනත් මූලාශ්‍රයන්ගේ ඇස්තමේන්තුගත බදු වන ආදායම් පමණක් මුළු ඇස්තමේන්තුගත ආදායමට ඇතුලත් කල යුතු වේ. කෙසේ නමුත් දල සේවා නියුක්ති ආදායම ද අනෙකුත් ආදායම් හා ඇතුලත් කර ගෙවිය යුතු ඇස්තමේන්තුගත බද්ද ගණනය කල යුතුය. (වෙනත් ආදායම් මත අදාල වන බදු අනුපාතය සොයා ගත් යුතු බැවිනි.)

04. මෙම ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය කොමසාරිස් ජනරාල් වෙත ගොනු කල යුතු වන්නේ පළමු බදු වාරිකය ගෙවනු ලබන දිනය වන 2018.08.15 දින වන අතර, (III) වන කොටසේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායමේ යම් වෙනස්වීමක් ඇත්නම් පමණක් මෙම ප්‍රකාශය සංශෝධනය කරමින් "**සංශෝධිත ප්‍රකාශයක්**" භාරදිය හැක.

**ඩී.එස්.කරුණාරත්න**

නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (බදු ප්‍රතිපත්ති)

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

කොළඹ 02

**ඩී. එස්. කරුණාරත්න**
**නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (බදු ප්‍රතිපත්ති)**
**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
**කොළඹ 02**